සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ඉතිහාසය I (II කොටස)
வரலாறு I (பகுதி II)
History I (Part II)

25 S I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

   (i) වලවේ ගඟ (ii) ඌරාතොට (iii) කැලණිය (iv) නාච්චදූව වැව
   (v) කුරුණෑගල (vi) කොට්ටියාරම (vii) බදුල්ල (viii) උතුරු පළාත

   (නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි; කෙටි සටහනකට ලකුණු **05** බැගිනි)

2. "මහාවංසය මහාවිහාරයේ වංසකථාවයි."

   (i) මහාවංසයට ලියන ලද ටීකාව නම් කරන්න. (ලකුණු 01 යි)

   (ii) මහාවිහාරයට අයත් වූ ප්‍රධාන උපොසථඝරය හා ප්‍රධාන ස්තූපය නම් කරන්න. (ලකුණු 02 යි)

   (iii) මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක්, මහාවංසයේ අඩංගු දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු, සෙල්ලිපිවලින් තහවුරු වන අයුරු සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

   (iv) මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක් මහාවංසය මහාවිහාරයේ වංසකථාව ලෙස සැලකීම කොතෙක් දුරට සාධාරණ ද? (ලකුණු 07 යි)

3. දුටුගැමුණු රජතුමා විසින් ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සඳහා ගෙන ගිය ක්‍රියාමාර්ගයට කාවන්තිස්ස රජුගෙන් ලද දායකත්වය ප්‍රමාණ කරන්න (ලකුණු 14 යි)

4. "පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය පුරාණ වාරිමාර්ග ඉතිහාසයේ උච්චතම අවස්ථාව සලකුණු කරයි." සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

5. දඹදෙණි යුගයේ වැදගත්කම පහත දැක්වෙන තේමා ඇසුරෙන් පරීක්ෂා කරන්න.

   (i) දඹදෙණිය රාජධානිය පිහිටුවීම
   (ii) විදේශ ආක්‍රමණිකයන් පරාජය කිරීම
   (iii) සංස්කෘතික ප්‍රබෝධය (ලකුණු 14 යි)

6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බලය බිඳවැටීමට තුඩුදුන් සාධක විවේචනාත්මකව විමසන්න. (ලකුණු 14 යි)

7. "බ්‍රිතාන්‍යයන් යටතේ වතුවගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයෙහි මූලික පරිවර්තනයක් ඇති කළේ ය."

(i) ශ්‍රී ලංකාවේ පළමුවරට කෝපි වත්තක් ආරම්භ කළ ඉංග්‍රීසි ජාතික වැවිලිකරුවා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) දහනවවන සියවසේ දී වගා කරන ලද ප්‍රධාන වාණිජ බෝග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) වතුවගාවේ ආරම්භයට උපකාරී වූ කෝල්බෲක් කොමිසමේ ප්‍රතිසංස්කරණ යෝජනා සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) දහනවවන සියවසේ වතුවගාවේ ව්‍යාප්තිය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ මූලික පරිවර්තනයක් සිදු වූ අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

8. **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

(B) 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස් වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) සීගිරිය

(ii) නිශ්ශංකමල්ල රජතුමා

(iii) ආර්යචක්‍රවර්ති පෙළපත

(iv) 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය

(v) ගොවි ජනපද ව්‍යාපාරය

(vi) 1956 මහා මැතිවරණය

(එක් කෙටි සටහනකට ලකුණු 07 බැගින්)

***